**ශීර්ෂය 251 - තක්සේරු දෙපාර්තමේන්තුව**
**--------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

තක්සේරු දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව තක්සේරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2024 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2024 ජූනි 12 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට තක්සේරු දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | හිඟ ආදායම් හඳුනා ගැනීම හා ලේඛන ගත කිරීම වෙනුවෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වා දී නොමැති වීම හේතුවෙන් වර්ෂය තුළ වැරදි නිවැරදි කිරීම් ලෙස රු.25,473,709ක අඩුකිරීමක් හා රු.7,463,331ක එකතු කිරීමක් ද මඟින් රු.18,010,373 ක් වූ ශුද්ධ හිඟ ආදායම් අඩු කිරීමක් සිදු කර ඇති බව නිරීක්ෂණය විය. | හිඟ ආදායම් හඳුනාගැනීම හා ලේඛන ගත කිරීම මුළුමනින්ම අතින් ක්‍රියාත්මක කිරීම, පළාත් කාර්යාලවල තොරතුරු නියමිත කාලයට ප්‍රධාන කාර්යාලයට නොලැබීම, පළාත් කාර්යාල මේ සම්බන්ධයෙන් ප්‍රමාණවත් සැලකිල්ලකින් තොරව කටයුතු කිරීම හා ගාස්තු කැඳවීම හිඟ අදායම් ගිණුමට ඇතුළත් කිරීමෙන් අනතුරුව අදාළ ආයතනවල ඉල්ලුම් අනුව හා මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය මත ගාස්තු සංශෝධනයන් සිදු කිරීම මෙම තත්වයට හේතු වී ඇත.<br><br>මෙම තත්ත්වය වැළක් වීම සඳහා ඉ-තක්සේරු ක්‍රමවේදයට ගිණුම් කටයුතු ස්වයන්ක්‍රීයව යාවත්කාලීන වන මොඩියුලයක් සකස් කිරීමට ඉල්ලීම් කර ඇත. | හිඟ ආදායම් හඳුනා ගැනීම හා ලේඛන ගත කිරීම වෙනුවෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන ක්‍රම හඳුන්වා දිය යුතු වීම. |
| (ආ) | 2023 දෙසැම්බර් 31 දිනට හිඟ තක්සේරු ආදායම් කාල විශ්ලේෂණයට අනුව මුළු හිඟ ආදායම වන රු.898,574,829 න් රු.676,792,851ක් හෙවත් 75%ක් වර්ෂ 01 සිට 15 | විගණන නිරීක්ෂණය සමඟ එකඟ වේ.<br><br>අමාත්‍යාංශයේ උපදෙස් ද ලබා ගෙන මෙම කල් ඉකුත් වී ඇති ශේෂයන් සම්බන්ධව වැඩි දුරටත් ගත හැකි ක්‍රියාමාර්ග විමසා බලා ඒවා ඉදිරියේ දී ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. | හිඟ ආදායම් අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | දක්වා වූ කාලයක සිට ඉදිරියට ගෙන එන තක්සේරු ගොනු 423කට අදාළව අය විය යුතු හිඟ තක්සේරු ගාස්තු බවත් මුළු හිඟ තක්සේරු ආදායමෙන් 70%ක් ආයතන 08ට අදාළ වන බවත් නිරීක්ෂණය විය. | තක්සේරු කටයුතු සඳහා අයකරනු ලබන ගාස්තුව ඉතා අධිකවීම, තක්සේරු ඉල්ලීමේ සිට තක්සේරුව දක්වා ගත වන කාලය තුළ දේපළ බැහැර කිරීම, අදාළ ආයතනවල අවශ්‍යතාවය වෙනස්වීම ආදිය මත මෙම තත්ත්වය ඇති වීමත්, විධිමත් ගිවිසුමක් නොමැති වීම මත නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට නොහැකිවීමත් මෙම තත්ත්වයට බලපා ඇති බව, හඳුනාගන්නා ලද බැවින් කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ඇතුව මුදල් අමාත්‍යාංශය මඟින් ගාස්තු අයකිරීමේ ක්‍රමවේදය සංශෝධනය කොට විධිමත් ක්‍රමවේදයක් 2023 ජුනි 01 දින සිට හඳුන්වා දී ඇත. මුදල් අමාත්‍යාංශය මඟින් ලබා දෙන උපදෙස් අනුව මේ වන විට ගිණුමේ පවතින හිඟ ගාස්තු පිළිබඳ කටයුතු කරනු ලැබේ. | |
| (ඇ) | 2022 දෙසැම්බර් 31 දිනට හිඟ තක්සේරු ආදායම වූ රු.719,500,478න් වැරදි නිවැරදි කිරීම් හා මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය යටතේ අඩුකිරීම් ගැලපීමෙන් පසු ශේෂය වන රු.699,232,135න් 2023 වර්ෂය තුළ රු.22,439,284ක් හෙවත් 3% ක් පමණක් අයකර ගෙන ඇති අතර ඒ අනුව හිඟ තක්සේරු ආදායම් අයකර ගැනීම කාර්යක්ෂමව සිදු නොවන බව නිරීක්ෂණය විය. | අදාළ අයතන ලිපි මඟින් දැනුවත් කිරීම, සිහි කැඳවීම් සිදු කිරීම හා ආයතනවල නිලධාරීන් සමඟ සාකාච්ඡා කිරීම, දෙපාර්තමේන්තුවේ ප්‍රගති සමාලෝචන රැස්වීම්වල දී හිඟ ආදායම් රැස්කර ගැනීම පිළිබඳ සාකච්ඡා කිරීම හා අදාළ පළාත් කාර්යාල දැනුවත් කිරීම, තක්සේරු වාර්තා රැගෙන නොයාම නිසා ඇති වූ හිඟ ආදායම් පිළිබඳ දෙපාර්තමේන්තුවේ නීති අංශය මඟින් හා අදාළ අමාත්‍යාංශය මඟින් එම ආයතන දැනුවත් කොට අවශ්‍ය නීතිමය කටයුතු සිදු කිරීම වැනි දේ හිඟ ආදායම් රැස්කර ගැනීමට සිදු කරයි.<br>මෙම ශේෂවලින් බොහෙමෙයක් තක්සේරු වාර්තා නිකුත් නොකරන ලද ඒවා වන අතර විවිධ හේතු මත අදාළ ආයතන විසින් තක්සේරු වාර්තා ලබා ගැනීමට අපේක්ෂා නොකරයි. මෙම ආයතන රාජ්‍ය සංස්ථා හා මණ්ඩල වීම සලකා මුදල් අමාත්‍යාංශයේ උපදෙස් අනුව ඉදිරි කටයුතු කරනු ලැබේ. | හිඟ ආදායම් අයකර ගැනීම සඳහා කටයුතු කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නාගරික සංවර්ධන අධිකාරිය (UDA) සහ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට (SLRDC) අදාළව 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා සිදු කළ තක්සේරු කටයුතු වෙනුවෙන් අයවිය යුතු හිඟ තක්සේරු ආදායම පිළිවෙලින් රු.171,814,919ක් හා රු.9,547,400ක් කාලීනව එකතුකරගැනීමට කටයුතු කර නොතිබුණි. | නාගරික සංවර්ධන අධිකාරියේ සහ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට අදාළ තක්සේරු ගොනුවලට අදාළ කටයුතු ආරම්භක අවස්ථාවේ දී ප්‍රධාන කාර්යාලයේ වෙනම අංශයකින් ක්‍රියාත්මක කර ඇති බැවින් මෙම තොරතුරු පළාත් කාර්යාලවලින් ලබා ගැනීමට අපහසු වී ඇති අතර අදාළ ආයතනවලට ප්‍රධාන කාර්යාලයේ තොරතුරු ලබාදීම මඟින් මෙම ගොනු පිළිබඳ ඉදිරි කටයුතු පවත්වාගෙන යනු ලැබේ. | විධිමත් පරිදි ලේඛන යාවත්කාලීනව පවත්වා ගැනීමටත් ආදායම් කාලීනව රැස්කර ගැනීමටත් කටයුතු කළ යුතුය. |
| (ඉ) | 2023 නොවැම්බර් 15 ආරම්භ කර තිබූ බැංකු ගිණුමට 2023 දෙසැම්බර් 31 දිනට රු.35,726,901ක් වූ තක්සේරු ආදායම් රාජ්‍ය ආදායමට බැර කර තිබුණ ද රු.3,076,174 ක් වූ තක්සේරු ආදායම සඳහා අදාළ වන ආයතනය හඳුනා ගෙන රිසිට්පත් නිකුත් කර නොතිබුණි. | තක්සේරු ආදායම් රැස් කිරීමට පමණක් භාවිතා කරන ගිණුමක් ලෙස 2023 නොවැම්බර් 15 දින ආරම්භ කරන ලද මහජන බැංකුවේ අංක 236-100-49026095 දරන ගිණුමට ලැබෙන ආදායම් දෛනිකව භාණ්ඩාගාරය විසින් ප්‍රේෂණය කර ගන්නා අතර මාසිකව සියලුම ආදායම් තක්සේරු ආදායමක් ලෙස භාණ්ඩාගාරය වෙත Cigas මෘදුකාංගය මඟින් ගිණුම් ගත කර කරනු ලබයි. හඳුනාගැනීමට හැකි තැන්පතු සඳහා රිසිට්පත් නිකුත් කරන අතර ඒවා තක්සේරු ආදායම් ලෙස අපගේ ආදායම් ලෙජර්වල ගිණුම් ගත කරගනු ලැබේ. නමුත් එම මාසය තුළ දීම හඳුනා ගැනීමට නොහැකි තැන්පතු විස්තර email හා whatsapp මඟින් විවිධ පළාත් කාර්යාල වෙත යොමු කරමින් ඉක්මනින්ම කඩිනමින් හඳුනා ගැනීම සඳහා ක්‍රියාමාර්ග ගනු ලැබේ. | තක්සේරු ආදායම් නිවැරදිව හා කඩිනමින් හඳුනාගෙන රිසිට්පත් නිකුත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | තක්සේරුව අදාළ වන ආයතනය හඳුනා ගත නොහැකි ලිපි ගොනු 04කට අදාළව රු.478,320ක් ද ගොනු අංකය සඳහන් නොවූ | දැනට සොයාගත හැකි පැරණිම ලේඛනවල ද මෙම තොරතුරු ඇතුළත් නොවේ. කෙසේ වුවද අදාළ පළාත් කාර්යාලය සඳහන් වන බැවින් ඔවුන්ගෙන් තොරතුරු ලබාගෙන ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. | හිඟ ආදායම්වලට අදාළ තොරතුරු නිවැරදිව ලේඛන ගත කළ යුතු වීම හා යාවත්කාලීන කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| | තක්සේරු ආදායම් ගොනු 04ක එකතුව රු.365,135ක් ද වශයෙන් මුළු එකතුව රු.843,455ක තක්සේරු ආදායම්, හිඟ ආදායම් වාර්තාවේ ඇතුළත්ව තිබුණි. | | |
| (උ) | තක්සේරු ගාස්තු අය කළ යුතු සහ අය කළ යුතු නොවන ආයතන සම්බන්ධයෙන් නිශ්චිත නිර්වචනයක් ඉදිරිපත් නොකිරීම සහ ඊට අදාළව ලැයිස්තුවක් පවත්වාගෙන යාමට පමණක් කටයුතු කිරීම හේතුවෙන් තක්සේරු ගාස්තු අයකළ යුතු සහ අය කළ යුතු නොවන ආයතන වෙන්කර හඳුනා ගැනීම ගැටළු සහගත වී ඇති බවත් ඒ හේතුවෙන් ගාස්තු අය නොකළ යුතු ආයතන 8කින් එකතුව රු.1,625,628ක් වූ ගාස්තු කැඳවා තිබූ බවත් නිරීක්ෂණය විය. | මෙම ආයතන නිශ්චිත නොවන අතර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ වාණිජ හා වාණිජ නොවන ආයතන වර්ගීකරණය අනුව ගාස්තු කැඳවීම හා ගාස්තු අය නොකිරීම තීරණය කරනු ලබයි. පළාත් කාර්යාල විසින් අතපසුවීමකින් අදාළ ගාස්තු අයකර ඇති බැවින් හිඟව පැවති තක්සේරු ගාස්තු හිඟ ආදායම් ගිණුමෙන් ඉවත් කරන ලදී. | තක්සේරු ගාස්තු අය කළ යුතු සහ අය නොකළ යුතු ආයතන නිශ්චිතව හඳුනා ගැනීමට කටයුතු කළ යුතු අතර ඒ පිළිබඳව පළාත් කාර්යාල ද දැනුවත් කළ යුතු වේ. |
| (ඌ) | 2023 වර්ෂයට අදාළ අය විය යුතු තක්සේරු ගාස්තු උපලේඛනයට අනුව දෙසැම්බර් 31 දිනට එකතුව රු.3,812,252 ක් වූ ගොනු 22 කට අදාළව අය විය යුතු තක්සේරු ගාස්තු හිඟ ආදායම් වාර්තාවට ඇතුළත් කර නොතිබුණි. | උපලේඛනයේ සඳහන් ගාස්තු කැඳවීම්වලින් කිහිපයක් තක්සේරු අත්තිකාරම්වලට අදාළ වන බැවින් හිඟ ආදායම් ගිණුමට ඇතුළත් නොවේ. අනෙකුත් ගොනු පිළිබඳව පළාත් කාර්යාලවලින් තහවුරුවක් ලබා ගැනීමෙන් අනතුරුව හිඟ ආදායම් ගිණුමට අවශ්‍ය සංශෝධන සිදු කිරීමට සටහන් කර ගන්නා ලදී. | හිඟ ආදායම් නිශ්චිතව හඳුනා ගැනීමට හා ලේඛන ගත කිරීමට අදාළ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කළ යුතු වීම. |

## 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විදුලිය හා ජලය සඳහා වූ 1403 වැය විෂය යටතේ දැරිය යුතු වූ රු.1,358,635ක්, 1409 වැය විෂය යටතේ දරා තිබුණු අතර පසුව 1403 වැය විෂයට මු.රෙ. 66 මාරුකිරීම් යටතේ රු.3,000,000ක අමතර ප්‍රතිපාදන ලබාගත් පසුව 1409 වැය විෂයෙන් රු.959,634ක් පමණක් 1403 වැය විෂයට නැවත මාරු කර ඇති බව නිරීක්ෂණය විය. ඒ අනුව 1409 වැය විෂය යටතට ගිණුම් ගත කළ ඉතිරි රු.385,802ක වියදම 1403 වැය විෂයට ගිණුම් ගත කළේ නම් 1403 විදුලිය හා ජලය වැය විෂයේ අධි ගෙවීමක් සිදු වන බව නිරීක්ෂණය විය. | ගම්පහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල පරිශ්‍රයේ ආරම්භ කරන ලද ගම්පහ පලාත් කාර්යාලයට අදාල මුදල් මුල් මාස කිහිපයේ විදුලිය, ජලය, ආරක්ෂක, පවිත්‍රතා, විදුලි සෝපාන නඩත්තු ආදී සියලුම වියදම් වර්ගීකරණයකින් තොරව ඉදිරිපත් කර තිබුණි. එසේ හෙයින් මෙම වියදම් සියල්ල එකතුවක් ලෙස නිශ්චිත වර්ගීකරණයකට අදාල නොවන වියදම් ගිණුම් ගත කල හැකි 1409 වෙනත් වියදම් ශීර්ෂය යටතේ ගිණුම්ගත කිරීමට සිදු වූ බව කාරුණිකව දන්වමි. | වාර්ෂික අයවැය ඇස්තමේන්තු හා මුදල් රෙගුලාසි විධි විධාන ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

## 2.3 රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම

පහත සඳහන් අධිවැය අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(i)** | අත්තිකාරම් බී ගිණුමේ කාල විශ්ලේෂණයට අනුව රු.1,443,035ක් වූ අයවිය යුතු ණය ශේෂයෙන් රු.356,632ක් හෙවත් සියයට 25ක් වර්ෂ 5ට වැඩි ණය ශේෂ වූ අතර මේවා 1996 සිට පැවත එන ණය ශේෂයන් විය. | විගණන නිරීක්ෂණය නිවැරදිය. | ණය අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| **(ii)** | වැඩ තහනම් කළ නිලධාරීන් තිදෙනකුගෙන් අය විය යුතු වසර 10 ඉක්ම වූ ණය ශේෂයන්ගේ එකතුව රු.308,614ක් වූ අතර මෙම ණය ශේෂ ඇපකරුවන්ගෙන් හෝ අයකර ගැනීමට මෙම වාර්තාවේ දිනය තෙක් කටයුතු කර නොතිබුණි. | වැඩ තහනම් කළ නිලධාරීන් තිදෙනෙකුගේ ණය ශේෂ අයකර ගැනීම සඳහා එම තොරතුරු නීතිපති වෙත යොමු කොට ඇති අතර ඒ පිළිබඳ ඉදිරි කටයුතු නීතිපති දෙපාර්තමේන්තුව විසින් සිදු කරමින් පවතී. | -එම- |
| **(iii)** | සේවය අතහැර ගිය නිලධාරියකු ගෙන් අයවිය යුතු වර්ෂ 5ක් ඉක්මවූ ණය ශේෂය රු.10,818ක් ඇපකරුවන්ගෙන් හෝ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය අයකර ගැනීම සඳහා ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගැනීමෙන් අනතුරුව සේවය අතහැර ගිය නිලධාරී එච්. සපරමාදු මයාගේ ණය ශේෂය කපා හැරීම සඳහා මු.රෙ. 113 විධිවිධාන ප්‍රකාරව නියෝග ලබා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇත. | සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතුවේ. |

**2.4 බැංකු ගිණුම් මෙහෙයවීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂය අවසානයට දෙපාර්තමේන්තුව සතුව බැංකු ගිණුම් 03ක් පැවති නමුත් මූල්‍ය ප්‍රකාශනවල ඇමුණුම **(viii)** ට අනුව ගිණුම් 02ක තොරතුරු පමණක් ඇතුළත් කර ඇති බව නිරීක්ෂණය විය. | මෙම ගිණුම අතපසුවීමකින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව සතු සියලු බැංකු ගිණුම් තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2023 වර්ෂයට අදාළව ඉදිරිපත් කළ කාර්යසාධන වාර්තාව අනුව වර්ෂය තුළ නිම නොකළ ඉතිරි වූ පොදු තක්සේරු ගොනු හා වරිපනම් තක්සේරු ගොනු පිළිවෙලින් 9,611ක් හා 7,854ක් බව නිරීක්ෂණය විය. | පිළිතුරු ලබා දී නොමැත. | තක්සේරු කටයුතු අප්‍රමාදව සිදු කිරීමට අවශ්‍ය ක්‍රමවේදයන් හඳුන්වාදී ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 3.2 වෙනත් නිරීක්ෂණ

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැලිගම ප්‍රාදේශීය සභාවේ සභා අරමුදලින් මිල දී ගත් මාතර කඹුරුගමුව කසල ඉඩමට යාබදව පිහිටි පර්චස් 100.85ක් වූ අංක 169 දරන කැබැල්ලට අදාළ 2022 නොවැම්බර් 20 දිනැති තක්සේරු වාර්තාව නිකුත් කිරීමේ දී ඉතා ආසන්න දිනක දී එනම් 2021 ජූලි 26 දින අත්සන් කර ඇති අංක 1375 දරන පරිහරණ ලැයිස්තුව සහිත පිඹුර සැලකිල්ලට නොගෙන 2015 පෙබරවාරි 25 දිනැති අංක 35/2015 දරන පරිහරණ ලැයිස්තුවක් නොමැති පිඹුර සැලකිල්ලට ගෙන ඉඩමේ හිමිකම තහවුරු කර ගෙන තිබුණි. තක්සේරු මූලධර්මවලට අනුව තක්සේරු කරනු ලබන දේපලේහි හිමිකාරීත්වය තහවුරු කර ගත යුතු වුවද ඊට පටහැනිව කටයුතු කිරීම හේතුවෙන් මෙම තක්සේරු වාර්තාව අදාළ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය අක්‍රමිකතාවයකට පාදක කර ගෙන ඇති බව අනාවරණය විය. | ඉඩමක් මිල දී ගන්නා අවස්ථාවක නිරවුල් අයිතිය පිළිබඳ සොයා බැලීම තක්සේරු දෙපාර්තමේන්තුවේ කාර්යභාරයක් නොවන අතර එය මිල දී ගන්නා පාර්ශවය ඒ පිළිබඳ විශේෂඥ දැනුමකින් යුත් නීතිඥයන් ලවා සිදු කර ගත යුතු කර්තව්‍යකි. ඒ බැවින් තක්සේරුව වාර්තා කිරීමේ දී අප විසින් නිරවුල් අයිතිය හා භිස් බුක්තිය ඇතැයි යන පදනම මත තක්සේරුව වාර්තා කර ඇත. | තක්සේරු මූලධර්මවලට අනුව තක්සේරු කරනු ලබන දේපලේහි හිමිකාරීත්වය තහවුරු කර ගත යුතු වේ. |
| (ආ) | කොළඹ වරාය පරිශ්‍රය තුල ස්ථාපිත කිරීමට යෝජිත බහාලුම් අංගනයට අදාළ අක්කර 12 රූඩ 02 පර්චස් 29ක් වූ ඉඩම විදේශීය සමාගමකට බදු දීම සඳහා, ශ්‍රී ලංකා වරාය අධිකාරියේ අතිරේක කළමනාකරණ | මුල් තක්සේරුවේ දී සැලකිල්ලට භාජනය නොවූ කරුණු 3ක් පදනම් කරගෙන ගාස්තු සංශෝධනය සිදු කොට ඇත. | දේපළ තක්සේරු කිරීමේ දී නිසි මූලධර්ම හා පදනම් අනුගමනය කර විනිවිදභාවයකින් යුතුව සිදු කිරීමටත් රජයට අවාසියක් නොවන |

| | | |
|---|---|---|
| අධ්‍යක්ෂ (තාක්ෂණික) විසින් කරන ලද ඉල්ලීමකට අනුව නිකුත් කර තිබූ තක්සේරු වාර්තාව අනුව වාර්ෂික බදු කුලිය රු.1,460,000,000 ක් වී තිබුණි. එසේ වුවද, පසුව අදාල විදේශීය සමාගම විසින් වරාය අධිකාරියේ අදාළ නිලධාරියා මගින් කරන ලද ඉල්ලීම් සැලකිල්ලට ගෙන මුල් තක්සේරුව සඳහා පාදක කරගත් ලියවිලිම නැවත සැලකිල්ලට ගෙන මුල් තක්සේරුවෙන් රු.228,000,000ක් හෙවත් 15.6%ක් අඩුවෙන්, රු.1,232,000,000ක් වූ සංශෝධිත තක්සේරු වාර්තාවක් නිකුත් කර ඇති බව නිරීක්ෂණය විය. | | ආකාරයටත් කටයුතු කළ යුතු වීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2023 දෙසැම්බර් 31 දිනට අනුමත සේවක සංඛ්‍යාවෙන් තනතුරු 380ක් හෙවත් සියයට 31ක් පුරප්පාඩු පවතින බවත්, පුරප්පාඩුවලින් 331ක් හෙවත් සියයට 87ක් ජ්‍යෙෂ්ඨ මට්ටමේ සහ තෘතීය මට්ටමේ තක්සේරු කාර්යයන් ඉටු කරන නිලධාරීන් වන බවත් නිරීක්ෂණය විය. | ජ්‍යෙෂ්ඨ මට්ටමට අයත් පුරප්පාඩු<br><br>විධායක නිලධර ගණයේ ශ්‍රී ලංකා තක්සේරුකරු සේවයේ I පන්තියේ III ශ්‍රේණියේ තක්සේරුකරු තනතුර සඳහා සීමිත පදනම මත පුරප්පාඩු 21 සඳහා සම්මුඛ පරීක්ෂණ අවසන් කිරීම හා විවෘත පදනම මත පුරප්පාඩු 21 සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනිම සඳහාත් මේ වන විට කටයුතු කරමින් පවතී.<br><br>තෘතීය මට්ටමට අයත් පුරප්පාඩු<br><br>ක්ෂේත්‍රගත/කාර්යාලගත නිලධාරි බණ්ඩ 2 නිලධාරි ගණයේ II පන්තියේ II ශ්‍රේණියේ සහකාර තක්සේරුකරු | විධිමත් පරිදි කටයුතු කර පුරප්පාඩු පිරවීමට හෝ තනතුරු යටපත් කිරීමට පියවර ගත යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | | තනතුරට බඳවා ගැනීම සඳහා තරඟ විභාගයක් මගින් සිදු කරන බඳවා ගැනීම වෙනුවට මේ අවස්ථාවට පමණක් සීමා වන පරිදි සේවා ව්‍යවස්ථාවේ විධිවිධානයන්ගෙන් බැහැරව සාමාන්‍ය බුද්ධි පරීක්ෂණයක් හා අභියෝගතා පරීක්ෂණයකින් සමන්විත ලිඛිත විභාගයක් මගින් බඳවා ගැනීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමැතිය ලබා දී ඇත. යෝජිත ප්‍රශ්න පත්‍රවල අන්තර්ගතය හා ව්‍යුහය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලද පසු පුරප්පාඩු කඩිනමින් සම්පූර්ණ කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.<br><br><u>ද්විතියික මට්ටම හා ප්‍රාථමික මට්ටම ට අයත් පුරප්පාඩු</u><br><br>ද්විතික හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු පිරවීමට කටයුතු කරන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත දැනුම් දීමට කටයුතු කර ඇති බවද කාරුණිකව දන්වමි. | |
| (ආ) | 2019 සැප්තැම්බර් 27 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පලකළ ශ්‍රී ලංකා තක්සේරු සේවය පිළිබඳ නව ව්‍යවස්ථා සංග්‍රහයට අනුව, උසස්වීම් සඳහා සම්පූර්ණ කළයුතු සේවා කාලය වැඩිවීම හේතුවෙන් 2023 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ හා තෘතීය මට්ටමේ විධායක නිලධාරීන්ගේ අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 42ක විශාල පුරප්පාඩු සංඛ්‍යාවක් ඇතිවී ඇති බව නිරීක්ෂණය විය. | මේ වන විට මෙම දෙපාර්තමේන්තුවේ තක්සේරුකරු තනතුරු ඇතුළු විධායක මට්ටමේ පුරප්පාඩු විශාල සංඛ්‍යාවක් පවතිනුයේ ඒ ඒ තනතුරට අදාළව සම්පූර්ණ කළ යුතු සේවා කාලය එම නිලධාරීන්ට නොමැති වීම හා දැනට දෙපාර්තමේන්තුවේ සිටිනුයේ නව සේවා ව්‍යවස්ථාවට අනුව උසස්වීම් ලැබූ නිලධාරීන් වීම හේතුවෙනි. | ආයතනික කටයුතු විධිමත්ව පවත්වා ගැනීමට අවශ්‍ය කටයුතු සැලසීම සඳහා උචිත හා කඩිනම් පියවර ගතයුතු වීම. |